**මහඔය ප්‍රාදේශීය සභාව - 2022**

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහඔය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාව වෙත ලබා දී තිබූ ලොරි බවුසරයේ වටිනාකම රු.14,000,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලොරි බවුසරයේ වටිනාකම රු.14,000,000 ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.1,263,384 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වැඩිපුර දක්වා තිබූ රු.1,263,384 අත්තිකාරම් වටිනාකම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ස්ථාවර තැන්පතුවකට අදාළව ලැබුණු පොලී ආදායම රු.140,138 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත නොකර ජ'නල් 89 මගින් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | ස්ථාවර තැම්පතුවෙහි රු.140,138 වටිනාකම දෝෂ නිවැරදි කිරීම ලෙස සටහන් කිරීම නිවැරදිකර පොළී ආදායමට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.41,194,145 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මගහැරී තිබූ රු.41,194,145 ක ණය හිමි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකාමර තැම්පතු ශේෂය රු.46,470,212 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වැඩියෙන් ගිණුම්ගත කර තිබූ රු.46,470,212 ක කඩකාමර තැම්පතු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළ දේශීය ණය පොලී වියදම රු.105,488 ක් ආදායම් වියදම් ගිණුමේ වැඩියෙන් දක්වා තිබුණි. | වාරිකය පොළිය වශයෙන් ගිණුම්ගත වී ඇති අතර එම වටිනාකම රු.105,488 නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු අත රැඳවුම් මුදල රු.1,177,049 ක් ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කසළ කළමනාකරණ මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියට අදාළව ලැබිය යුතු හා ගෙවිය යුතු අත රැඳවුම් මුදල රු.428,730 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු අත රැඳවුම් මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,479,682 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.4,148,060 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 500,000 | 430,200 | 430,200 | - | 800,000 | 130,380 | 130,380 | - |
| ii. | කුලී ආදායම | 10,083,402 | 15,823,744 | 9,338,219 | 6,879,574 | 2,860,000 | 7,714,108 | 7,709,358 | 394,050 |
| iii. | බලපත්‍ර ගාස්තු | 350,300 | 298,442 | 298,442 | - | 1,592,000 | 866,200 | 866,200 | - |
| iv. | වෙනත් ආදායම් | 2,159,912 | 518,879 | 518,879 | - | 45,280,000 | 31,368,778 | 34,119,113 | 8,093,479 |
| v. | එකතුව | 13,093,614 | 17,071,265 | 10,585,740 | 6,879,574 | 50,532,000 | 40,079,466 | 42,825,051 | 8,487,529 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **කුලී** | | |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කඩ කුලී ආදායම රු.5,431,962 ක් වූ අතර හිඟ කඩ කුලී නොගෙවන්නන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි. | මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඉදිරියේදී මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු කුලී ආදායම රු.1,447,611 ක් වූ අතර එම මුදල් අයකර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුව පැවතුණි. | මෙම බදු කුලී ආදායම් අයකර ගැනීමට අදාළව මේ වන විට කටයුතු කර ඇති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වලංගු ගිවිසුම් කාලය ඉක්මවා තිබූ ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 129 ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම් යාවත්කාලීන කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු මෝටර් ග්‍රේඩරය කුලියට ලබා දී මාස 9 සිට මාස 15 දක්වා කාලයක් ගතව ඇති රු.146,250 ක් වටිනා හිඟ ශේෂ 02 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී නීත්‍යානුකූලව කටයුතු කරන බව. | විධිමත් ලේඛනයක් භාවිතා කළ යුතු අතර හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.142,237,813 ක් වූ ස්ථාවර වත්කම් එක් එක් අයිතම අනුව වටිනාකම හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසුව නිවැරදිව වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | වටිනාකම් නිවැරදිව ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 28 ක වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සුසාන භූමි 28 හි වටිනාකම ගිණුම්ගත කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලද භාණ්ඩ අයිතම 24 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වටිනාකම් නොලැබීම හේතුවෙන් ගිණුම්ගත කිරීම සිදු නොකළ බව. | -එම- |
| (ඈ) | සභාව භාරයේ පවතින වාහන 03 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට හා වාහන 02 ක් අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට සභාව විසින් වර්ෂ 05කට අධික කාලයක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභාව නමට පවරා ගැනීමට අදාළ කටයුතු හා වෙන්දේසි කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව. | අයිතිය පවරා ගැනීමට හා භාවිතා කළ නොහැකි වාහන වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ වසර 02කට අධික කාලයක සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර හා තවත් තනතුරු 09 ක පුරප්පාඩු සම්බන්ධයෙන් වරින් වර පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබුණ ද විගණන දින වන විටත් එම පුරප්පාඩු සම්පූර්ණ වී නොතිබුණි. | මේ සම්බන්ධව කාර්තු වාර්තා මඟින් අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇති බව. | පුරප්පාඩුව සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |